# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 ජුනි මස 19 වන දින
## II වන කොටස

## අතිරේකය
(2026.06.25 දින නිකුත් කරන ලදී)


# ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන)

**1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කම්කරු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 25.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ පවත්නා මූල්‍යමය දණ්ඩනය රුපියල් දසදහසක දඩයක සිට රුපියල් ලක්ෂයක දඩයක් දක්වා ඉහළ දැමීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ පවත්නා මූල්‍යමය දණ්ඩනය රුපියල් දසදහසක දඩයක සිට රුපියල් ලක්ෂයක දඩයක් දක්වා ඉහළ දැමීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ පවත්නා මූල්‍යමය දණ්ඩනය රුපියල් දසදහසක දඩයක සිට රුපියල් ලක්ෂයක දඩයක් දක්වා ඉහළ දැමීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන, 13 වන සහ 20අ වන වගන්තිවලට කරන ලද සංශෝධන මේ පනත ක්‍රියාත්මක වීමට පෙර සිදු කරන ලද වැරදි සඳහා පනවන ලද දඩ සම්බන්ධයෙන් අදාළ වීම බැහැර කරනු ලැබේ.

## ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන)

එල්. ඩී- ඕ. 55/2025

### 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2026 අංක      දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1956 අංක 47 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් දසදහසක්" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් දසදහසක්" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් දසදහසකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව සිදු කරනු ලබන වැරදි

5. 7, 13 සහ 20අ වගන්ති සඳහා සිදු කර ඇති සංශෝධන මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව මෙම පනතේ ඉහත සඳහන් 7, 13 සහ 20අ යන වගන්ති යටතේ සිදු කර පවත්නා වූ යම් වරදක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

PL 15797 - 465(2026/06)

**6**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව